සරසවි සිසුවෙකු, ජන. 17, 2023 දින කොළඹ තුරඟ තරග පිටියේදී සරසවි සිසුවියක ඝාතනය කොට පසුව දිවි තොර කරගැනීමට තැත් කිරීම සහ ඔහු පොලිස් අත්අඩංගුවට පත් වීම සමාජ මාධ්‍ය තුළත්, මාධ්‍ය තුළත් දැඩි අවධානයකට ලක්වූ සිදුවීමක් විණි. බොහෝ මාධ්‍ය වාර්තාවන්ට අනුව, සැකකරුගේ නීතීඥවරයා විසින්, සැකකරු මානසික සංකූලතාවයකට ප්‍රතිකාර ගන්නා බව ද පෙන්වා දී ඇත. ඒ අනුව, ඔහුව ජාතික මානසික විද්‍යායතනය වෙත යොමු කොට වාර්තාවක් ලබා ගන්නා ලෙසට ද මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිණි.

ඒ අනුව, මෙම සිදුවීම ඝාතන-දිවි තොර කරගැනීමට තැත් කිරීමේ සිදුවීමක් ලෙසින් සැලකීමට සිදුවේ. මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව, සිදුවීම් වලට වඩාත් වැඩි මාධ්‍ය සහ සමාජ අවධානයක් ලැබේ. එනිසාම, එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී වැඩි ප්‍රවේසමක් සහ ආචාර ධාර්මික ප්‍රවේශයක් අනුගමනය කිරීම අනිවාර්ය වේ.

එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී, හදිසි උපකාර අංක සඳහන් කිරීම අත්‍යවශ්‍ය වන්නේ ද ඒ හෙයිනි.

ජන. 18, 2023 දින, තෝරාගත් රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් තුළ මෙම සිදුවීම වාර්තා කිරීමේදී, හදිසි උපකාරක අංක සඳහන් කර තිබූ හෝ සඳහන් කර නොතිබූ ආකාරයන් මෙසේ දැක්විය හැක. (YouTube වෙත එක් කොට තිබූ, ජන. 18, 2023 දින රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් ඇසුරිණි.)

හදිසි උපකාරක අංක:

*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308

*1333-CCCline

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Guidance_for_reporting...

https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...



**කොළඹ තුරඟ තරග පිටියේ සිදු වූ බව පැවසෙන ඝාතනය: සැකකරු පිළිබඳ වාර්තාකරණය**

සිදු වූ බවට පැවසෙන ඝාතන-දිවි තොර කර ගැනීමේ ප්‍රයත්නය වාර්තා කිරීමේදී උපකාරක අංක පළ කළ හෝ නොකළ මාධ්‍ය

| නාලිකාව | වාර්තා කල ආකාරය |
|---|---|
| ITN Sri Lanka | උපකාරක අංක පළ කර නොමැත. |
| සිරස TV | උපකාරක අංක පළ කර නොමැත. |
| TV | උපකාරක අංක පළ කර නොමැත. |
| tvG | උපකාරක අංක පළ කර නොමැත. |
| | උපකාරක අංක පළ කර නොමැත. |
| | දිවි තොර කරගැනීමේ උත්සාහය පිළිබඳ වාර්තා කර නොමැත. |
| | පුවත වාර්තා කර නැත. |

YouTube වෙත එක් කොට ඇති ජනවාරි 18, 2023 දින රූපවාහිනී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් ඇසුරිණි.

ETHICS